## අතුරු තහනම් නියෝගය.

<u>කොළඹ දිසා අධිකරණයේදී ය.</u>

කොළඹ 10, ශ්‍රී විපුලසේන මාවතේ, අංක.167/4 දරණ ස්ථානයේ නිහාල් ශ්‍රී අමරසේකර.

<u>පැමිණිලිකරු.</u>

| | | |
|---|---|---|
| නඩු අංකය | : 3155/විශේෂ | එදිරිව |
| ස්වභාවය | : විශේෂ | |
| වටිනාකම | : රු.100,000/- | |
| කාර්ය පටිපාටිය | : සාමාන්‍ය | |

1. ජපානයේ නීති යටතේ සංවිධානය වී තිබෙන හා පවත්නා සමාගමක් වන, ජපානයේ ටෝකියෝ නුවර, චියෝඩා-කු, ඕටමචි 1-චෝම් හි 2-1 දරණ ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය තිබෙන සහ කොළඹ 02, වොක්ෂෝල් වීදියේ, අංක.315, දරණ ස්ථානයේ, ශ්‍රී ලංකාවේ සම්බන්ධිකරණ කාර්යාලයයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් තිබෙන මිට්සූයි ඇන්ඩ් කම්පැනි ලිමිටඩ්.

2. ජපානයේ නීති යටතේ සංවිධානය වී තිබෙන හා පවත්නා සමාගමක් වන, ජපානයේ ටෝකියෝ නුවර, ෂින්ජුකු-කු, නිෂි-ෂින්ජුකු 1-චෝම් හි 25-1 දරණ ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය තිබෙන හා මහරගම, හයිලෙවල් පාරේ, අංක.65 දරණ ස්ථානයේ ශ්‍රී ලංකාවේ සම්බන්ධිකරණ කාර්යාලයයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් තිබෙන තායිසෙ කෝපරේෂන්.

3. ජපනයේ නීති යටතේ නිසි ලෙස සංවිධානය වී තිබෙන සංස්ථාවක් වන සහ ජපානයේ ටෝකියෝ නුවර, මිනාටෝ-කු,

අටාගෝ 1-2-2, මොරි ගොඩනැගිල්ලේ අංක.9 දරණ ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය තිබෙන ගෘහ නිර්මාණ ශිල්පීන් සහ සැලසුම්කරුවන් වන කන්තො කිකාකු සෙක්කිෂා යෝෂෝ ෂිබාටා ඇන්ඩ් ඇසෝෂියේට්ස්.

4. කලින් ලංකා ජැපෑන් හොටෙල්ස් ලිමිටඩ් වශයෙන් හැඳින් වූ සහ කොළඹ 03, ඇල්ෆ්‍රඩ් පෙදෙසේ, අංක.16 දරණ ස්ථානයේ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ්.

5. කොළඹ 03, ඇල්ෆ්‍රඩ් පෙදෙසේ, අංක.16 දරණ ස්ථානයෙහි හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ සභාපති/කළමණාකාර අධ්‍යක්ෂ කෝර්නල් ලයනල් පෙරේරා.

6. කොළඹ 03, ධර්මපාල මාවතේ, අංක.51/3 දරණ ස්ථානයේ පදිංචි සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ ෆ්‍රෙඩ්රික් ජර්මේන් නොයෙල් මෙන්ඩිස්.

7. කොළඹ 07, ශ්‍රීමත් ආර්නස්ට් ද සිල්වා මාවතේ, අංක.23/2 දරණ ස්ථානයේ පදිංචි සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කයිර්ෂාස්ප් නරිමාන් චොක්සි.

8. කොළඹ 06, හැව්ලොක් පාරේ, අංක.696/2 දරණ ස්ථානයේ පදිංචි සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ දොන් පීටර් සෙවරිනස් පෙරේරා.

9. ජාපනයේ, කසගාව, චිගසාකි, ෆුජිමිචෝ, 6-38 දරණ ස්ථානයේ සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කෂුටාකා කොබෝයි.

10. කොළඹ 06, රාමක්‍රිෂ්ණා මාවතේ, අංක.4 දරණ ස්ථානයේ සහ හොටෙල් ඉඩෙවලොපර්ස් (ලංකා) ිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කනපතිපිල්ලේ ශන්මුගලිංගම්.

11. දැනට කොළඹ 02, වොක්ෂෝල් වීදියේ, අංක.315 දරණ ස්ථානයේ සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කොජි ඉතෝ.

<u>විත්තිකරුවෝ.</u>

<u>ඉහත නම සඳහන් 1 වැනි, 2 වැනි, 3 වැනි සහ 4 වැනි විත්තිකරුවන් වෙතය.</u>

මෙම නඩුවේ 1990.09.18 දින නිකුත් කළ වාරණ නියෝගය සමඟ ඔබ වෙත භාරදුන් ඉහත නම සඳහන් පැමිණිලිකරුගේ 1990 සැප්තැම්බර් මස 12 දිනැති දිවුරුම් පතේ පිටපත හා 'පී1' සිට 'පී54' දක්වා ලකුණු කළ ලියකියවිලිවල පිටපත් සහ මෙයට පිටපතක් අමුණා ඇති 1990 සැප්තැම්බර් මස 13 දිනැති පැමිණිලි පතේ (උ) හා (ඌ) ආයාචනාවල අයැද ඇති පරිදි අතුරු තහනම් නියෝග සඳහා වන ඉල්ලීමක් පැමිණිලිකරු කර ඇති හෙයින්,

1991 ඔක්තෝබර් මස 28 වැනි දින මෙම කාරණය කොළඹ දිසා විනිසුරු, තැන්පත් පී.විජයරත්න මැතිතුමා ඉදිරිපිට පැමිණිලිකරු වෙනුවෙන් නීතිඥ ද සිල්වා සහ පෙරේරා ව්‍යාපාරයේ උපදෙස් පිට නීතිඥ ඒ.ඒ.ඇම්.ඉලියාස් මහතා, නීතිඥ ඇස්.ශ්‍රීස්කාන්ත මහතා සහ ජනාධිපති කේ.කනග්-ඊස්වරන් මහතා සමඟ රාජනීතිඥ පී.නවරත්නරාජ මහතා ද, 1 වැනි සහ 2 වැනි විත්තිකාර සමාගම් වෙනුවෙන් නීතිඥ රස්මාරා ආබ්දීන් මහතා ද, 3 වැනි විත්තිකාර සමාගම වෙනුවෙන් නීතිඥ ඇස්.ඩී.යෝගේන්ද්‍රා මහතා ද, 4 වැනි විත්තිකාර සමාගම වෙනුවෙන් රජයේ නීතිඥ ටී.පී.ගුණරත්න මහතා ද පෙනී සිටියදී ගනු ලැබූ අතර, එකී 4 වැනි විත්තිකාර සමාගම අතුරු තහනම් නියෝගය සඳහා වන එකී ඉල්ලීමට විරෝධතා ඉදිරිපත් නොකර එකී පැමිණිලිපත, දිවුරුම් පත සහ 'පී1' සිට 'පී54' දක්වා ලකුණු කළ ලියකියවිලි ද ඉහත කී 1 වැනි, 2 වැනි සහ 3 වැනි විත්තිකාර සමාගම්වල විරෝධතා ප්‍රකාශ සහ ඒ සමඟ ගොනු කර ඇති ලියකියවිලි සලකා බලා, තවද නීතිඥ මහතුන් ඉදිරිපත් කළ කරුණුවලට සවන් දී පැමිණිලිපතේ එකී (උ) සහ (ඌ)

ආයාචනා පරිදි, 1 වැනි, 2 වැනි, 3 වැනි සහ 4 වැනි විත්තිකාර සමාගම්වලට විරුද්ධව අතුරු තහනම් නියෝග නිකුත් කළයුතු බවට මෙයින් අධිකරණය නියෝග කළ හෙයින් ද,

ඒ අනුව ඉහත නම සඳහන් 1 වැනි විත්තිකාර ඔබ සමාගම, ඔබ සමාගම විසින්ම හෝ ඔබ සමාගමේ නියෝජිතයින්, සේවකයින් සහ වෙනත් කොයිකවර හැටියකින් වුවත්,

මෙම නඩුවේ අවසාන නිගමනය කරන තුරු පැමිණිලිපතේ සඳහන් කර ඇති ගිවිසුම්, එනම් ඉදිකිරීමේ ගිවිසුම, සැපයීමේ ගිවිසුම, සැලසුම් සහ අධීක්ෂණ ගිවිසුම, ණය ගිවිසුම සහ එකී ඈපකර දෙක යටතේ කොයිකවර ආකාරයකින් වුවත් මොන මොන කවර මුදලක් හෝ නියම කර ඉල්ලා සිටීමෙන්, ඉල්ලා සිටිමෙන්, අරගැනිමෙන්, ලබාගැනිමෙන් සහ/හෝ එකතු කර ගැනීමෙන්

තහනම් කර වළක්වා දැන් නියෝග කරන අතර, මෙම අධිකරණය මෙයින් නියෝග කරනු ලැබේ.

මෙම නියෝගයට අවනත වීමට හා ඒ අනුව ක්‍රියා කිරිමට ඔබට මෙයින් නියම කරනු ලැබේ.

මේ නිසා මෙය පැහැර හැරිම අනුව නීතියෙන් දඩුවම් පමුණුවනු ලැබේ.

1991 ක්වූ ඔක්තෝබර් මස 28 දිනෙන් යුතුව මාගේ අත්සනින් නිකුත් කරන ලදී.

අත්සන් කළේ /- කොළඹ දිසා විනිසුරු.

... විසින් යතුරු ... කරන ලදී.

අත්... පැමිණිලිකරුගේ නීතිඥයින්.

---

යතුරු ... යා සසඳා බැලුවේ: [signature]

මෙහි සඳහන් වනුයේ කොළඹ දිසා අධිකරණයේ අංක 3155/විශේෂ/පී.එල්.

... නඩුවේ 1වන විත්තිකරු වෙත නිකුත් කල අතුරු තහනම් නියෝගයේ සත්‍ය පිටපතක් බව මෙයින් සහතික කරමි.

[signature] [signature]

රෙජිස්ට්‍රාර්.